www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මනියෙහි ව්‍යවස්ථා අධිකරනය යුරෝපා සංගමය පිලිබඳව ජාතිකවාදී නියෝගයක් පනවයි

## German's Constitutional Court issues nationalist ruling on European Union

**2009 ජුලි 04**

යුරෝපයේ අනාගත වර්ධනය කෙරෙහි පුලුල් පරාසයකින් යුතු අතුරු ප්‍රතිවිපාක ඇතිකරන්නා වූ විනිශ්චයක් ෆෙඩරල් ව්‍යවස්ථා අධිකරනය (බීවීජී) විසින් ජුලි 2 දින ලබා දී ඇත. කාල්සෲහි පැවැත්වූ මෙම අධිකරන සැසිය යුරෝපා සංගමයෙහි බලතල සම්බන්ධයෙන් සීමාවන් පටු කල අතර සියලුම වැදගත් ප්‍රශ්න පිලිබඳව අවසන් තීන්දුව, ජාතික රාජ්‍යයේ, එනම්, ජර්මානු පාර්ලිමේන්තුවෙහි මන්ත්‍රන සභා දෙක හා එම අධිකරනය ම මත රැඳෙනු ඇතැයි නියම කලේය.

යුරෝපීය පාර්ලිමේන්තුවෙහි ප්‍රජාතන්ත්‍රීය සුජාත භාවය ගැන ප්‍රශ්න කල මෙම අධිකරනය අවසාන විනිශ්චයන් දීමේ යුරෝපීය අධිකරනය සතු අයිතිය බැහැර කලේ ය.

අසාර්ථක වූ යුරෝපීය ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කිරීම සඳහාත් යුරෝපා සංගමයට වැඩි බලතල පැවරීම සඳහාත් සකසන ලද ලිස්බන් සම්මුතියට එරෙහි අභියාචනා ගනනාවක් සම්බන්ධයෙන් බීවීජීය නියෝග නිකුත් කලේ ය. අයර්ලන්තය, පෝලන්තය හා චෙක් සමූහාන්ඩුව ද ඇතුලුව ලිස්බන් සම්මුතිය මෙතෙක් අනුමත නොකල යුරෝපා සංගමයේ එකම සාමාජිකයා ජර්මනිය යි. බුන්ඩෙස්ටාග් හා බුන්ඩෙස්රාට් යන ජර්මානු පාර්ලිමේන්තුවෙහි මන්ත්‍රන සභා දෙක ලිස්බන් සම්මුතිය පිලිබඳ එකඟතාවය පල කල නමුදු බීවීජීයෙහි විනිශ්චය ලැබෙන තෙක් ජර්මානු ජනාධිපති හෝර්ස්ට් කොහ්ලර් එයට සිය අත්සන තැබීම අත්හිටුවීය.

ලිස්බන් සම්මුතිය මූලික වශයෙන් ජර්මානු ව්‍යවස්ථාවට ඇතුලත් වූවත් එය අනුමත කල හැක්කේ බුන්ඩ්ස්ටාග් හා බුන්ඩස්රාට් යන මන්ත්‍රන සභා දෙක පරිපූරක නීතියක් පූර්න වශයෙන් ප්‍රතිශෝධනය කිරීමෙන් අනතුරුව පමනක් බව අධිකරනය දැන් තීරනය කොට ඇත. නව පරිපූරක නීතිය වෙනුවෙන් බීවීජීය පනවන ලද විස්තරාත්මක පරාමිතියන්, ලිස්බන් සම්මුතිය එහි ප්‍රතිවිරුද්ධය බවට පත් කරයි. ලිස්බන් සම්මුතිය, යුරෝපා සංගමයට හා එහි ආයතනවලට අමතර බලය හා තීරනය ගැනීමෙහි ලා අමතර බලතල පවරන අතර බීවීජීයෙහි විනිශ්චය යුරෝපා සංගමයෙහි බලය සීමා කරයි. බ්‍රසල්ස්හි නොව ජර්මනියෙහි පමනක් තීරනය කල හැකි "මුඛ්‍ය ක්ෂේත්‍රයන්" එය විශේෂයෙන් සඳහන් කරයි.

මෙම මුඛ්‍ය ක්ෂේත්‍රවල ලැයිස්තුව සවිස්තරාත්මක ය, දිගු ය. "එය මුලු මහත් ජනගහනයේ ජීවන තත්ත්වයන් හැඩ ගස්සවන හා විශේෂයෙන් සංස්කෘතික, ඓතිහාසික හා භාෂාමය පූර්ව සංකල්පයන් මත රඳා පවතින" සියලු දේශපාලන ක්ෂේත්‍රයන් ආවරනය කරයි. නිදසුන් වශයෙන් බීවීජීය විශේෂයෙන් සඳහන් කරනුයේ අපරාධ නීතිය, පොලීසිය, මිලිටරිය, බඳු සමාජ දේශපාලන ශික්ෂනය, අධ්‍යාපනය, මාධ්‍ය නියාමනය හා ආගමික ප්‍රජාවන්ට දක්වන සැලකිල්ල යන ක්ෂේත්‍රයන් ය. විනිශ්චයට අනුව ජර්මානු ආන්ඩුව හා අධිකරනය විසින් ඒ සියලු ක්ෂේත්‍රයන්හි බලය යුරෝපා සංගමයට පැවරීම තහනම් කිරීමට ජර්මානු ව්‍යවස්ථාවට හැකි වේ.

එවැනි ප්‍රශ්න සම්බන්ධයෙන් තීරන ගැනීමට යුරෝපීය පාර්ලිමේන්තුවට, බලයක් නැතැයි ද බීවීජී තීන්දුව ප්‍රකාශ කරයි. යුරෝපීය පාර්ලිමේන්තුව "සමාන සර්වජන ඡන්ද බලය මත පදනම්ව තෝරා පත්කරගෙන නොමැති" බවත් "කේන්ද්‍රීය වැදගත්කමකින් යුතු දේශපාලන කරුනු සම්බන්ධයෙන් තීරන ගැනීමේ" බලයක් එයට පැවරී නොමැති බවත් තීන්දුවෙන් කියැවේ. එය "යුරෝපයෙහි ස්වෛරී ජනතාව" නියෝජනය නොකරයි. ඒ වෙනුවට එය සාමාජික රටවල ජනතාව නියෝජනය කරන ජාතික සීමා ඉක්මවන ආයතනයකි.

යුරෝපා සංගමය සිය බලය අතික්‍රමනය නොකිරීම සහතික කරන අභියාචන අධිකරනයක් ලෙස ක්‍රියා කිරීමට බීවීජීය අපේක්ෂා කරයි. යුරෝපීය නීතිමය ගැටලු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරනය තමන් ම යයි සලකන යුරෝපා අධිකරනය (ඊසීජේ) සමග මේ හේතුවෙන් ගැටුමකට මං පෑදෙයි. මේ සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය කටයුතු පිලිබඳ නීතිඥ රූපට් ස්කොල්ස් ප්‍රකාශ කලේ අනාගතයේ දී ජර්මානු ව්‍යවස්ථා අධිකරනය යුරෝපා සංගම් අධිකරනය "පසුපස එලවනු

ඇති" බවත්, තමන් ඊසීජේයට දෙවෙනි නොවන ලෙස තමන්ව සලකාගන්නා බවත්ය. යුරෝපා සංගමය සිය ස්වෛරීභාවය පිලිබඳ අයිතිවාසිකම් විස්තාරනය කිරීම සඳහා දිගින් දිගටම කටයුතු කරන්නේ නම් එම සංගමයෙන් ඉවත් වීමට පවා කාල්සෲහි අධිකරන විනිසුරුවන් නිර්දේශ කරයි. බීවීජීයෙහි විනිශ්චයට අනුව, "අයහපත් ම අවස්ථාවෙහි දී ජර්මනිය, තව දුරටත් යුරෝපා සංගමය තුල සිය සහභාගිත්වය ප්‍රතික්ෂේප කල යුතු ය."

දශක ගනනාවක් තිස්සේ යුරෝපීය ඒකාග්‍රකරනය ශක්තිමත් කිරීමත් ව්‍යාප්ත කිරීමත් අරමුනු කොට ගත් ජර්මනියේ යුරෝපය පිලිබඳ ප්‍රතිපත්තිය පූර්න වශයෙන් ආපසු හැරවීමක් ව්‍යවස්ථාමය අධිකරන තීරනයෙන් අර්ථ ගැන්වෙයි. රටෙහි විශාලත්වය හා ආර්ථික වැදගත්කම හේතු කොට ගෙන මේ ක්‍රියාවලිය තුල වක්‍ර මගකින් ජර්මනිය ප්‍රබල බලපෑමක් පවත්වාගෙන ගොස් ඇත. දැන් ජාතික ආසක්තයන් විවෘතව ම ඉදිරියට පැමින ඇත. එෆ්ඒඉසෙඩ් පුවත්පත එම විනිශ්චය මෙසේ සම්පින්ඩනය කොට දැක්වීය: "කාල්සෲවට යුරෝපය සමග ඇති සිය මිත්‍රත්වය තමන් කැමති වාර ගනනක් අවධාරනය කල හැක - එනමුදු සැබෑ පනිවුඩය නම්: අපි ඒ ඇඳුමින් සැරසී සිටින බවයි."

විනිශ්චයෙහි ප්‍රතිපලය වනුයේ යුරෝපය පුරා ජාතික ගැටුම් තීව්‍රවීමයි. යුරෝපා සංගමයෙහි විශාලතම සාමාජිකයා වශයෙන් ජර්මනිය, සිය ජාතික ආසක්තයන්ට ප්‍රමුඛත්වය දෙන්නේ නම්, යුරෝපා සංගමයේ අන් සාමාජිකයන් 26 දෙනා ද එ පරිදි ම කටයුතු කරනු ඇත. ලෝක ආර්ථික අර්බුදය ගැඹුරුවත්ම වඩාත් පැහැදිලිව ඉස්මතුවී ඇති ප්‍රවනතාවක් බීවීජී විනිශ්චය ශක්තිමත් කරයි. එනම්, 20 වැනි ශතවර්ෂය තුල යුරෝපය වෙත අවස්ථා දෙකකදී ම ව්‍යසනකාර ප්‍රතිපල ගෙන දුන් ජාතිකවාදී ගැටුම් යලි අලුත් වී පැතිරයාමකි.

කාල්සෲහි විනිශ්චය කෙලින්ම පීටර් ගෝවේලර්විසින් මෙහෙයවන ලද ව්‍යාපාරයක ප්‍රතිපලයකි. ඔහු බැවේරියානු කොන්සවේටිව් ක්‍රිස්තියානි සමාජ සංගමයෙහි (සීඑස්යූ) දකුනු මායිමේ ස්ථානගත වූ ජර්මානු පාර්ලිමේන්තුවෙහි සාමාජිකයෙකි. මේ සංගමය ක්‍රිස්තියානු ප්‍රජාතන්ත්‍රීය සංගමය සමග සංධානගතවූවකි. ගෝවේලර් සීඩීයූ/සීඑස්යූ පාර්ලිමේන්තු කන්ඩායමට විරෝධය පාමින් ලිස්බන් සම්මුතියට එරෙහිව තමන්ගේ ම ව්‍යවස්ථාමය ඇපෑල ඉදිරිපත් කලේ ය. අධිකරනයෙහි විනිශ්චය මගින් සිය ආස්ථානය පූර්න වශයෙන් අනුමත කරන ලදැයි ඔහු සලකයි.

"ජාතීන්ගෙන් සමන්විත යුරෝපයක්" පිලිබඳ අදහස ව්‍යවස්ථා අධිකරනය මගින් නිදොස් බවට තහවුරු කරන ලදැයි කාල්සෲ විනිශ්චය පිලිබඳ විස්තර සටහනින් ඔහු ප්‍රකාශ කලේ ය. මෙම යෙදුම මුලින්ම තනන ලද්දේ 1962 වසරේදී ප්‍රන්ස ජනාධිපති චාල්ස් ඩිගොල විසිනි. ඉන් අනතුරුව එය දක්ෂිනාංශික යුරෝපා හවුල පිලිබඳ සංශයවාදීන් හා යුරෝපා සංගම් විරෝධීන් විසින් තමන් හඳුන්වාදීමේ නාම පත්‍රය බවට පත්කරගෙන ඇත. ජර්මානු ජාතික පක්ෂය (එන්පීඩී) හා ප්‍රන්ස ජාතික පෙරමුන (එෆ්එන්) වැනි ෆැසිස්ට්වාදී පක්ෂ විසින් ද මේ වැකිකඩ යොදා ගනු ලැබේ.

ගෝවේලර්ට සුබ පැතීමෙන් හා අධිකරන තීරනය වර්නනා කිරීමෙන් වැලකී සිටීමට බුන්ඩෙස්ටාග්හි සියලුම පක්ෂවල නායකයෝ මෙය හේතුවක් කර නොගත්හ. ලිස්බන් සම්මුතියට මෙය "යහපත් දවසකැ"යි චාන්සලර් ඇන්ජලා මර්කල් කියා පෑවා ය. මෙම විනිශ්චය ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට සහාය වන බව අභ්‍යන්තර ඇමති වුල්ෆ්ගෑංශෝබල් (සීඩීයූ) ප්‍රකාශ කලේ ය. මෙම තීන්දුවෙන්, බුන්ඩස්ටාගය ශක්තිමත් කරන බවට ප්‍රකාශ කරමින් සමාජ ප්‍රජාතන්ත්‍රීය පක්ෂ (එස්පීඩී) කන්ඩායම වෙනුවෙන් යුරෝපීය ප්‍රකාශක, ඇක්සල් ෂෝෆර් හා හරිත පක්ෂයේ ප්‍රමුඛ අපේක්ෂකජර්න් ට්‍රිටින් ද එය වර්නනා කලහ.

ගෝවේලර්ට වඩාත්ම උද්‍යෝගිමත් සහාය ලැබුනේ වාම පක්ෂයෙනි. මේ පක්ෂය ලිස්බන් සම්මුතියට එරෙහිව තමන්ගේ ම අභියාචනය ඉදිරිපත් කර තිබුනි. පසුගිය බදාදා පාර්ලිමේන්තු නියෝජිතයින් මෙම තීන්දුව සාකච්ඡාවට භාජනය කල අවස්ථාවේ දී ජර්මානු පාර්ලිමේන්තුව තුල අපූරු දර්ශනයක් රඟදැක්විනි. අපකීර්තිමත් දක්ෂිනාංශිකයෙකු වන ගෝවේලර් විසින් පවසන ලද සෑම වැකියකට ම පාහේ වාම පක්ෂයෙහි පාර්ලිමේන්තු නියෝජිතයෝ ආවේගී ලෙස අත්පොලසන් දුන්හ. වාම පක්ෂ නායක ග්‍රෙගෝර් ගයිසි කිහිප වාරයක් ගෝවේලර්ට සිය ස්තුතිය පුද කලේ ය. ලිස්බන් සම්මුතිය පිලිබඳ සිය විරෝධය ගෝවේලර්ගේ විරෝධයෙන් වෙන් කොට විදහා දැක්වීමට හේතුවක් වාම පක්ෂයට නොපෙනුනි. ඒ වෙනුවට, මෙම විනිශ්චය ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහනයක් ලෙස වාම පක්ෂය ප්‍රශංසාත්මකව හුවා දැක්වී ය. "ෆෙඩරල් ආන්ඩුවටත් බුන්ඩස්ටාග්හි බහුතරයටත් ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳව පෞද්ගලික වශයෙන් පාඩමක්" බීවීජීය විසින් උගන්වන ලදැයි වාම පක්ෂයෙහි නායකත්වය විසින් නිකුත්කරන ලද ප්‍රකාශයකින් කියැවිනි.

ඒ හා සමාන ප්‍රතිචාර ලිබරල් කවයන් අතරින් ද පල විය. සුඩ්ඩොයිට්ෂේ සේතුං හි දේශීය කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා වූ ද ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා කල සේවය වෙනුවෙන් ප්‍රදානයන් රැසකට හිමිකම් කියන්නා වූ ද හෙරිබර්ට් ප්‍රැන්ට්ල් මෙම විනිශ්චය හැඳින්වූයේ "යුරෝපයට විශාල වැදගත්කමක් ඇති මොහොතක්" ලෙස ය. එය යුරෝපීය

ඒකාග්‍රකරනයට එරෙහිව මෙහෙයවන ලද්දක් නොව, ජනතාවගේ අභිමතය කේන්ද්‍ර කොට ගත් "ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම අවධාරනය කරන්නකි." එය "බ්‍රසල්ස් තන්ත්‍රයෙහි බලහත්කාරකමට" තිත තැබීය. ප්‍රැන්ට්ල්ට අනුව විනිශ්චය ලබාදීමට මැදිහත් වූයේ "යුරෝපීය විවේචකයන් අට දෙනෙකු" විසින් නොව, "යුරෝපීය ප්‍රජාතන්ත්‍රවාදීන් අට දෙනෙකු" විසිනි. විනිශ්චය මගින් බුන්ඩස්ටාගය වඩාත් ප්‍රජාතන්ත්‍රවීමට නියමිතව ඇතැයි ඔහු ලිවීය.

යුරෝපා සංගමය පිලිබඳ එබය තුල පටලැවී ඇති පන්ති ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රැන්ට්ල් හා වාම පක්ෂය අන්ධය. ඒ දෙකොටසට ම "බ්‍රසල්ස් තන්ත්‍රයෙහි බලහත්කාරකම" යන්න ජාතික ස්වෛරීභාවය ශක්තිමත් කිරීම හා සමානාර්ථවාචක පද සංයෝජනයකි. යුරෝපා සංගමය ප්‍රජාතන්ත්‍ර විරෝධී වන අතර බුන්ඩස්ටාගය ජනතා ස්වෛරීත්වයේ මූර්තිය වේ. මෙය ජනගහනය වැඩිවැඩියෙන් නිල දේශපාලනයෙන් වියෝ වන තත්ත්වය සැම මැතිවරනයකින් ම පෙන්නුම් කෙරෙන වාතාවරනයක් තිබිය දී ද එසේ කියනු ලැබේ. ඇෆ්ගනිස්ථානයෙහි මිල්ටරි මෙහෙයුම, හාට්ස් iv සුබසාධක ගෙවීම් හා අනේකවිධ වෙනත් ප්‍රශ්න සම්බන්ධයෙන් බුන්ඩස්ටාගය ගෙන ඇති ස්ථාවරයන් ජර්මානු ජනතාවගෙන් බහුතරයකගේ අභිමතයට ඉඳුරාම පටහැනිය.

මේ ආකල්පය හේතු කොට ගෙන වාම පක්ෂය හා ප්‍රැන්ට්ල්, සමග එක පෙලට යුරෝපා සංගමයට විරෝධය පලකරන අන්ත දක්ෂිනාංශික කොටස් ද සන්ධානගත වේ. ඊට බ්‍රිතාන්‍ය කොන්සවේටිව්වාදීන් කසින්ස්කි සොහොයුරන්ගේ පෝලන්ත පීඅයිඑස් සංවිධානය හා වෙනත් පිලිකුල් කටයුතු සංවිධාන ද ඇතුලු වේ. යුරෝපා සංගමයඅරභයා මේ සංවිධාන දක්වන විරෝධය ජාතික ස්වෝත්තමවාදය, වර්ගවාදය හා එතරම් විරල නොවූ යුදෙව් විරෝධය සමග සංකලනය වී ඇත.

බීවීජිය විසින් සකසන ලද "මුඛ්‍ය ක්ෂේත්‍ර" පිලිබඳ දිගු ලැයිස්තුවෙහි සැලකිය යුතු හිඩැසක් ඇති බව සැලකිල්ලට ගැනීමට ප්‍රැන්ට්ල් හා වාම පක්ෂය අපොහොසත් වේ - වෙලඳපොලවල්, සමාගම් හා මූල්‍ය ආයතන ජාතික ස්වෛරීභාවයට යටත් වන්නේ නැත. බීවීජිය ලිස්බන් සම්මුතියට ප්‍රතිපත්තිමය වශයෙන් කොල එලිය නිකුත් කොට ඇත්තේ එබැවින් ය. එහි විනිශ්චය එල්ල කෙරෙන්නේ බ්‍රසල්ස්හි ප්‍රතිපත්ති තීරනය කරනු ලබන මූල්‍යමය හා ආර්ථික අවශ්‍යතාවන්ගේ බලයට එරෙහිව නොවේ. අනික් අතට, කම්කරු පන්තියේ පැත්තෙන් වර්ධනය වන විරෝධතා මෙල්ල කිරීමේ හැකියාවක් බ්‍රසල්ස් වෙතින් දුරස්ත වූ ආයතනවලට නොමැති වනු ඇතැයි යන බියක් එයට ඇත. එම නිසා පොලිසිය හා අධිකරනය වැනි ජාතික රාජ්‍ය හා එහි මර්දන යන්ත්‍රයට ඇතුලත් වන මෙවලම් ශක්තිමත් කිරීමෙහි ලා එය නිරත වේ.

ආර්ථික වශයෙන්, බීවීජී විනිශ්චයට පාදක වන ජාතික වාදය ඊටත් වඩා ප්‍රතිගාමී වේ. යුරෝපීය කර්මාන්ත ගැඹුරු ලෙස එකට බද්ධ වී ඇත. නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් යුරෝපය තුල හා ජාත්‍යන්තරව දස ලක්ෂ සංඛ්‍යාත කම්කරු හමුදාවක් එකම බැම්මකින් වෙලී සිටී. ජාතික සීමා මායිම් නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයට බොහෝ කලක සිට බාධකයක් බවට පත්ව ඇත. යුරෝපය ඒකාබද්ධ කිරීම ඉතා හදිසි අවශ්‍යතාවකි. එනමුදු, නිෂ්පාදන බලවේග පෞද්ගලික අයිතිය මත පවතින තාක් කල් හා සුලුතරයකගේ ධනය වර්ධනය වීම කෙරේ යොමුව ඇති තාක් කල් යුරෝපීය ජනතාවගේ ආසක්තයන්ට ගැලපෙන ඒකාබද්ධ වීම සිදු විය නොහැක්කකි. ලාභ හා වෙලඳපොලවල් සඳහා කෙරෙන අරගල ජාතික පදනමේ එදිරිවාදිකම් වලට අනිවාර්යයෙන්ම අනුබල දෙයි. මේ එදිරිවාදිකම්, අර්බුද හා යුද්ධ ඇති වීම දක්වා වර්ධනය වේ.

ලිස්බන් සම්මුතිය තුලින් මෙය තහවුරු කෙරේ. එම සම්මුතිය, මහාද්වීපයෙහි වඩාත් බලගතු මූල්‍යමය හා ආර්ථික අවශ්‍යතාවන් ගේ ක්‍රියාකාරකම්වලට ඇති සීමා තව දුරටත් ඉවත් කරයි. යුරෝපය තුල සමාජමය බෙදීම ගැඹුරු කරයි. සංක්‍රමනිකයන්ට එරෙහිව ඇති සීමා හා වැටකඩොලු ශක්තිමත් කෙරෙයි. පොලීසිය හා සෝදිසි කිරීම් තර කරයි.

මෙම සම්මුතියට එරෙහිව අරගලය මෙහෙය විය හැක්කේ සමාජවාදී පදනමක් මත පමනි. ඒ සඳහා යුරෝපීය ඒකාබද්ධතාවය අවශ්‍යවේ. ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා සටන සමාජ අසමානතාවට එරෙහි අරගලය හා වෙන් කල නොහැකි සේ එකට බැඳී ඇත. එවැනි අරගලයක එල්ලය වනුයේ ජාතික ස්වෛරීභාවය ආරක්ෂා කිරීම නොව, ඒ වෙනුවට, යුරෝපා එක්සත් සමාජවාදී රාජ්‍යයන් ගොඩ නැගීමයි.

හතර වැනි ජාත්‍යන්තරය ද ජර්මනියෙහි හා බ්‍රිතාන්‍යයෙහි එහි ශාඛාවන් වන සමාජවාදී සමානතා පක්ෂ ද අනුගමනය කරන වැඩ පිලිවෙල මෙයයි.

පීටර් ශ්වාර්ස් විසිනි.

© www.wsws.org